විල්සන් හෑගොඩ සූරින්ගේ 94 වන ජන්ම දිනය සැමරේ.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ නිර්මාතෘ විල්සන් හෑගොඩ සූරින්ගේ 94 වන ජන්ම දිනය යෙදී තිබූ 2009 ජනවාරි 08 වැනි දින සංගමයේ සාමාජික සාමාජිකාවන් විසින් බෝධිපූජා පිංකමක් පවත්වන ලදී. මෙම පිංකම තලාහේන බෝධිරුක්ඛාරාම විහාරස්ථානයේ දී විහාරාධිපති ආචාර්ය පූජ්‍යපාද අත්තරගම ඤාණවිමල නාහිමිපාණන් විසන් පවත්වන ලද අතර, මෙයට සංගමයේ සභාපතිතුමා ඇතුළු සාමාජික සාමාජිකවෝ රැසක් දායක වූහ.

සාමාජික මුදල් ගෙවීම.

2009 වසර සඳහා සාමාජික මුදල් ලංකා බැංකුවේ බම්බලපිටිය ශාඛාවේ අංක 717752 දරණ ගිණුමට ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය හැකි අතර, එම මුදල් ගෙවූ ලදුපතෙහි මුල් පිටපත ආවරණ ලිපියත් සමග සාමාජික අංකය හා නම නිවැරදිව සඳහන් කර මුදල් අධ්‍යක්ෂ වෙත ලැබීමට සලස්වන්න. වාර්ෂික සාමාජික මුදල රු. 300/= ක් වන අතර, මහාබෝධි විද්‍යාලයේ පංති පැවැත්වෙන අතරතුර මුදල් අධ්‍යක්ෂ වෙත සාමාජික මුදල් ගෙවීමේ හැකියාව ද ඇත. කලට වේලාවට සාමාජික මුදල් ගෙවා ඔබගේ සාමාජිකත්වය තහවුරු කරගන්නා මෙන් දන්වන අතර, ඔබගේ නම සාමාජික ලේඛනයෙන් ඉවත් කළ පසු නැවත නව අංකයක් යටතේ සාමාජිකත්වය ලබාගැනීමට සිදුවනු ඇත.

සුභ නව වසරකට ආසිරි
2009 වසරට නව සාමාජික සාමාජිකවාන් බඳවා ගැනීම.

නව සාමාජික අයදුම් පත්‍රය නිකුත් කර ඇති අතර එහි සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත. තවත් සීමිත පිරිසක් සඳහා ඉඩකඩ ඇති බැවින් අලුතින් සාමාජිකත්වය ලබාගැනීමට අවශ්‍ය අය වෙනුවෙන් ඉතා ඉක්මනින් විධායක අධ්‍යක්ෂ N. R. අබේසිංහ මහතා වෙත 9X4 ප්‍රමාණයේ ලිපිනයැති මුද්දර කවරයක් සමග ලිපියක් යොමු කරන්න.

නව වසර සඳහා 2009 පෙබ. 15 වන දින පංති ආරම්භ වන අතර සුපුරුදු පරිදි ෆොස්ටර් පටුමගේ පිහිටි මහාබෝධි විද්‍යාලයේ ඉරු දිනවල ප.ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා පංති පැවැත් වේ.

නව වසරේ පංති කාල සටහන

| | | |
|---|---|---|
| පංති ආරම්භය | - | 2009 පෙබරවාරි 15 |
| පෙබරවාරි | - | 15, 22 |
| මාර්තු | - | 01, 08, 15, 22, 29 |
| අප්‍රේල් | - | 05 (විහාරමහා දේවි උද්‍යාන චාරිකාව), 26 |
| මැයි | - | 10, 17, 24, 31 (කැලණි විහාරය චාරිකාව) |

පංති පැවැත්වීම සහ චාරිකා පිළිබඳ වැඩිදුර විස්තර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් හෝ පංති භාර උපදේශකවරුන්ගෙන් ලබා ගත හැකියි.

46 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2008

සංගමයේ 46 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය 2009 ජනවාරි මස 18 වන දින කොළඹ සහ කුරුණෑගල යන මධ්‍යස්ථාන දෙකෙහි දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම.

සංගමයේ 2008/2009 අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම 2009 පෙබරවාරි මස 01 වැනි ඉරු දින අංක 56/2, කඩවත පාර, කළුබෝවිල පිහිටි සංගමයේ නව ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානයේ දී පැවැත්වේ.

14 වන ජාත්‍යාන්තර ඡායාරූප ප්‍රදර්ශනය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය විසින් සංවිධානය කළ 14 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය 2008 ඔක්තෝබර් මස 10 සිට 13 වනදා දක්වා කොළඹ ජාතික කලාභවනේ දී පවත්වන ලදි. මෙය අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාගේ අතින් විවෘත වූ අතර මෙම ඡායාරූප තරගයේ තේරීම් කමිටුව ලෙස ඉන්දියාවේ මහාචාර්ය සුබ්‍රතෝ රේ, ඇතුළු ප්‍රවීණ ඡායාරූප කලාවේදීන් පිරිසක් කටයුතු කළහ.

වෘත්තීය කණ්ඩායමේ ''කැමරා කාච'' පිළිබඳ වැඩමුළුව

වෘත්තීය කණ්ඩායම මගින් සංවිධානය කරන ලද තවත් වැඩමුළුවක් 2008 දෙසැම්බර් මස 07 වන දින

මහවැලි කේන්ද්‍රීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ''කැමරා කාච'' පිළිබඳව පවත්වන ලද මෙම වැඩමුළුවේ සම්පත් දායකයින් ලෙස විජය බස්නායක, ලාල් හෑගොඩ සහ ලාල්සිංහ යන මහත්වරුන් කටයුතු කළ අතර නිකෝන් හා කැනන් කැමරා සහ කාච ගෙන්වා බෙදා හරින ෆොටෝ ටෙක්නිකා සහ මෙට්‍රොපොලිටන් යන ආයතන මේ සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලදී.

සංගමයට පරිත්‍යාගයක්

සංගමය ආරම්භයේ සිට ම පැවති අඩුපාඩුවක් තාවකාලිකව හෝ පිරිමසා ගැනීම සඳහා සංගමයේ සාමාජිකයන් දෙපළක් වන චින්තක තේනුවර හා පූර්ණිකා තේනුවර ඔවුන්ගේ සහෝදරියගේ නිවසක් සංගමයේ පරිහරණය පිණිස තාවකාලිකව ලබා දී ඇත. මේ පිළිබඳ සංගමයේ සියලුම සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් ඔවුන් වෙත හෘදයංගම ස්තූතිය මෙසේ පිරිනමමු.

ලංකෙම් ආයතනයේ 2009 දින දර්ශනයට චින්තකගේ ඡායාරූපයක් යොදා ගැනේ.

ලංකෙම් ආයතනය විසින් 2009 වසර සඳහා මුද්‍රණය කරනු ලබන ඔවුන්ගේ දින දර්ශන සඳහා සංගමයේ සාමාජික චින්තක තේනුවරගේ ඡායාරූප 3ක් යොදාගෙන ඇත. මෙහි දී ලංකෙම් ආයතනය විසින් කරන ලද ඉල්ලීමකට අනුව සංගමයේ සාමාජික සාමාජිකවාන්ගේ ඡායාරූප විශාල ප්‍රමාණයක් ඔවුන් වෙත ඉදිරිපත් කෙරුණු අතර ඔවුන් විසින් චින්තක ගේ ඡායාරූප 3 ක් ඒ සඳහා තෝරා ගන්නා ලදී. මෙම කාර්යයේ සම්බන්ධීකරණ කටයුතු සංගමයේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වන ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රියන්ත අබේසුන්දර මහතා විසින් සිදු කරන ලදී.

මහාබෝධියේ තාප්පය සංගමය මගින් විචිත්‍රවත් කෙරේ.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ පංති පැවැත්වෙන ෆොස්ටර් පටුමගේ පිහිටි මහා බෝධි විද්‍යාලයේ තාප්පය පාසැල් සිසුන් හට ආදර්ශවත් චිත්‍ර මගින් විචිත්‍රවත් කිරීමට සංගමය කටයුතු කරගෙන යයි. මෙම චිත්‍ර ඇඳීම සිදුකරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රියන්ත අබේසුන්දර ගේ මූලිකත්වයෙන් වන අතර මේ සඳහා අවශ්‍ය වන තීන්ත ලංකෙම් රොබියලැක් ආයතනය විසින් නොමිලේ ලබා දී ඇත.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ව්‍යුහය

2008 / 2009 අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| සභාපති | - | ඡායාරූප සම්මාන පිළිබඳ නිර්දේශ අනුකමිටුව,<br>සාමාජික අත්පොත් අනුකමිටුව |
| විධායක අධ්‍යක්ෂ | - | වෙබ් අඩවි අනු කමිටුව |
| අධ්‍යක්ෂ මුදල් | - | මුදල් අනු කමිටුව |
| අධ්‍යක්ෂ අධ්‍යාපන | - | අධ්‍යාපන අනුකමිටුව, අධ්‍යාපන සේවා අනු කමිටුව. |
| අධ්‍යක්ෂ ලේඛකාධිකාරී | - | ලේඛන කටයුතු ස්ථාවර පාලන අනු කමිටුව |
| අධ්‍යක්ෂ ප්‍රකාශක | - | ලංකා කැමරා අනු කමිටුව, පිළිසඳර අනු කමිටුව |
| අධ්‍යක්ෂ ප්‍රදර්ශන | - | ප්‍රදර්ශන අනු කමිටුව |
| අධ්‍යක්ෂ සමාජ සේවා<br>හා සුබ සාධන | - | සමාජ සේවා හා සුබ සාධන අනු කමිටුව, ප්‍රභාලේඛිකා අනු කමිටුව, |
| අධ්‍යක්ෂ සංවර්ධන<br>හා ප්‍රවර්ධන | - | වෘත්තීය කණ්ඩායම, ප්‍රචාරක අනු කමිටුව, ගොඩනැගිලි අනු කමිටුව |

(අනු කමිටුවලට ඇතුළත්ව සිටින සියලු සාමාජික නාම සඳහා මීළඟ පිළිසඳර බලන්න)

2009 පංතිභාර උපදේශකවරු

| | | |
|---|---|---|
| පළමු වසර | - | ජූඩ් සී. සිල්වා මයා |
| දෙවන වසර | - | අශෝක ජේමසිරි මයා |
| තෙවන වසර | - | එස්. ඩී. පියදාස මයා |

2009 මාසික තරඟ උපදේශකවරියන්

තිනේෂා අරුණශාන්ති එදිරිසිංහ මෙය

අමාලි නානායක්කාර මෙය

චම්පා දමයන්ති මෙය

නොමිලේ පරිගණක පුහුණු පාඨමාලාවක්

ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය විරෝධී සංගමයේ (SLANA) විසින් පවත්වනු ලබන දින 7 ක පරිගණක පුහුණු පාඨමාලාවක් නොමිලේ හැදෑරීමේ අවස්ථාව සංගමයේ සාමාජිකයින් හට ලබා දී ඇත. මෙහි සම්බන්ධීකරණය සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ අතුල රණරාජ් විසින් සිදු කරන අතර 0714 268090 හා 071 8033481 අංකවලට ඇමතීමෙන් වැඩිදුර විස්තර ලබා ගත හැකියි.

සොබා දහමේ රිද්මය 2008 වැඩමුළුව

අධ්‍යාපන කමිටුව විසින් සංවිධානය කරනු ලබන සොබා දහමේ රිද්මය ව්‍යාපෘතියට අදාළ වැඩමුළු චාරිකාවක් පසුගිය දෙසැම්බර් මස 12, 13, හා 14 බුන්දල වනෝද්‍යානය ආශ්‍රිතව පවත්වන ලදී. මෙම වැඩමුළුවේ චාරිකා ආශ්‍රිතව ලබා ගත් ඡායාරූප ඇතුළත් ''සොබා දහමේ රිද්මය'' ඡායාරූප ප්‍රදර්ශනය 2009 වසරේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

PSA Club Competition

ඇමෙරිකානු ඡායාරූප සංගමය (PSA) මගින් ඔවුන්ගේ සාමාජිකත්වය දරණ ඡායාරූප සංගම්වල සාමාජිකයින් සඳහා පවත්වනු ලබන ඡායාරූප ප්‍රදර්ශනය වෙත ඡායාරූප ඉදිරිපත් කිරීමේ හැකියාව ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයින් හට දැන් ලැබී ඇත. මෙය ඡායාරූප ඉදිරිපත් කිරීමට කැමති අයට ප්‍රදර්ශන අධ්‍යක්ෂ සුනිල් වික්‍රම මහතා වෙතින් හෝ සමන්ත සේනක බණ්ඩාර මහතා වෙතින් වැඩි විස්තර ලබා ගත හැකියි.

සංගමයේ ශෝකය

සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු හා ප්‍රවීණ ජනමාධ්‍ය ඡායාරූප ශිල්පියෙකු වූ කුමාර දයාවංශ මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය.

සංගමයේ සාමාජික දෙවන වසර ශිෂ්‍ය ඩී. පැතුම් රංගන (08/5424) ගේ පියාණන් 2008 අගෝස්තු මස 21 වන දින අභාවප්‍රාප්ත විය.

සංගමයේ සාමාජික අතුල වතුදුරගේ මහතාගේ මාමණ්ඩිය වූ ද, සාමාජිකා සඳරේඛා විජේනායක මහත්මියගේ පියාණන් වූ ද            මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය.

එම අභාවයන් පිළිබඳව සංගමයේ ශෝකය පළකර සිටිමු.

අනේ නොදැනිම මේ අසිරිය මගේ කැමරාවට ලක් වුණා

කිචි බිචි හඬ නගා කුරුළු කොබෙයියන් වසන්තයේ ඉගි ලුණා
තුරු ලතාවන් නොයෙක් පැහැයෙන් මල් එල ගැන් වුණා
නදී ගංගා ඇළ දොළින් මහා කෙත් වතු සරු වුණා
ගල් පර සිඳ බිඳ දමා සයුරෙන් සුදෝ සුදුවන් රළ මතු වුණා

සිංහ රාජේ සිංහ ගලෙන් ප්‍රෞඪ ඉතිහාසය මතු වුණා
සිංහ ගිරියේ බිතු සිතුවම්වලින් පුරාණය කිය වුණා
තිසා වැවෙන් හා අභය ගිරියෙන් මසිත කුල්මත් වුණා
අනේ නොදැනිම මේ අසිරිය මගේ කැමරාවට ලක් වුණා

පාට පාට සමනලයින් සමන් ගිරට සදිසාවෙන් ඉගි ලුණා
යාල අභය භූමියෙන් අලි ඇතුන් පණ නළ ගැන් වුණා
නෙක කුරුලු කුරුල්ලන් කුමණ පාරාදීසයේ රජ වුණා
අනේ නොදැනිම මේ අසිරිය මගේ කැමරාවට ලක් වුණා

රන් දෙරණෝ නීල ගොයම රන් පාටින් දිලි හුණා
නිල් අඹරේ පාට පාට දේ දුන්නක් සතොසින් හිනැ හුණා
ගිගි රි වළලු හඬට බයේ මලිති බටිත්තන් ඉගි ලුණා
අනේ නොදැනිම මේ අසිරිය මගේ කැමරාවට ලක් වුණා

රත් පැහැ ලා හිරු කන්ද උඩින් නැළවි නැළවි මතු වුණා
ශීත මද නළින් සැරසී මල් කැකුළු පාට පාටින් මුකුලිත වුණා
රන් පැහැ සඳ දැක කිරි පැණි ඉල්ලා ළඳරු දෑත් විහි දුණා
අනේ නොදැනිම මේ අසිරිය මගේ කැමරාවට ලක් වුණා

සෙයිද් ෆිරදවුස්බි හනිෆ්ඩීන්
පළමු වසර - 5410

පරිත්‍යාගය

කුසගින්නට පලවැල ද .....
පිපාසයට දිය පොදක් ......
සෙවනට හව්හරණක්,
රෝගී වූ ඔබට මා ගත රුහිරු මිරිකා
යුෂ, පොතු, මුල්, මල් ද
එතකුදු ද නැත...
ඔබේ ජීවන හුස්ම පොද පවා
පිරිසිදු කළෙමි....
මෙසේ දන් දෙමි
මා ගත පවා දැවමය ලෙස
අවසන් හුස්ම හෙළමි
දැවී යමින් දර කැබලිව
ඔබ තනි නොකර දර සෑයේ දී ද
බලන් ඔබ ළග මා තනියට සිටි සැටි....
පින්සිදු වෙයි....
මා දරුවන් රැකගන්න....
ඔබ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් වත්.

එච්. කේ. ජයමිණි බුද්ධිකා
4573 (3 වන වසර)

අහෝ ඛේදයකි

පෙර සිටි රජ දරුවන්
වෙහෙසවා ගත සිත
දුන් දායාද වේ
අප ජාතික උරුම
අහෝ ඛේදයකි
කලු වළාවකි
රටත් ජාතියත් නැත්තවුන් සේ
වනසයි, විකුණයි
අප ජාතික උරුම

ලොකු ලොකු දෙවොලවලට අධිගෘහිත
යක්, පිසාච, කුම්භාණ්ඩ ආදීන්
ගිජු වී ලෙව කෑමට දොළ පිදේනිය
විකුණයි අපේ ප්‍රෞඪත්වය
කුමට සිටිමු ද කුමට බලමු ද
වෙමු එක් රිදී රේඛාවක්
කලු වලාවකට
නංවමු අපි සැවොම එක් වී
සිහල කම ඉහළට

ඩබ්. චතුරංග අල්විස්
දෙවන වසර - 5189

ආලෝකය

නෙත් මානයේ හැඩ වන ඡායාව
නෙතට ආලෝකය ලැබුණු ඡායාව
නෙතෙන් හැඩ කර ලබා ගත් ඡායාව
එයයි මා නෙත ගැටුණු ඡායාව

මිනිසුන් සිනා වන හැටි බලන්නට
මිනිසුන්ගේ දුක්මුසු මුහුණු දකින්නට
හදවත කියන දෑ මුහුණින් බලන්නට
මා පිං කර ඇත ඒ ගැන කියන්නට

ගස් අතු අතරින් හිරු දෙවි හිනැහෙන්නේ
හිරු රැස් නිසයි මේ ලොව පවතින්නේ
හිරු රැස් වැටුණු විට වන ගොමු පිබිදෙන්නේ
ඒ රැස් නිසයි මාගත් රාමුව හැඩ වන්නේ

පොල් අතු සිදුරින් පුන්සඳ ගෙට එන්නේ
ගෙයි ඇති අඳුර ඒ එළියට නැති වෙන්නේ
පුංචි මල්ලි සඳ එළියට හිනැ හෙන්නේ
මුතුවන් සිනාව මා සිත තුළ ගිල ගන්නේ

පහන් දැල්ලේ සුන්දර බව දැක ගන්නේ
මෙරුවන් පහන් දැල්ල මත රඟ දෙන්නේ
නිමේෂයකි උන් හැම දෙන මිය යන්නේ
මගේ නෙතු අගට ඒ එළිය ද සුව දෙන්නේ

ඩී. එන්. අනෝජා පෙරේරා
දෙවන වසර
(5018)